# රැකියා අවස්ථාවක්

## කර්මාන්ත අමාත්‍යාංශය

## ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ පවතින, පහත සඳහන් පුරප්පාඩුව සඳහා සුදුසුකම්ලත්, ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

(මෙම විෂයයේ තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021-11-22 වන දින දක්වා දීර්ඝ කර ඇත)

## අධ්‍යක්ෂක - තනතුරු 01

**ප්‍රධාන වගකීම්**

I. අධිකාරියේ, සියලුම මෙහෙයුම්, පරිපාලන සහ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ වගකීම දැරිය යුතුය.

II. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ (NEDA) හි, වටිනාකම්, මෙහෙවර, දැක්ම තක්සේරු කිරීමට සහ කෙටි කාලීන හා දීර්ඝ කාලීන ඉලක්ක හා එල්ලයන් සපුරා ගැනීමට අධ්‍යක්ෂක මණ්ඩලයට සහාය විය යුතුය.

III. ජාතිකව හා ජාත්‍යන්තරව, ඉටුකරනු ලබන සියලු ප්‍රවර්ධන කටයුතු හා සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය (SME) සංවර්ධනය පිළිබඳව, සෘජුව මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.

IV. නීතිමය කරුණු කාරණා සම්බන්ධව සිය කාර්යයන් සම්බන්ධීකරණය කිරීම හා අවශ්‍යවිට හා අවස්ථාවන්හිදී උසාවි අධිකරණ/ කම්කරු විනිශ්චය සභාවන්හිදී ආයතනය නියෝජනය කිරීම.

V. ප්‍රවණතා ගැටළු, කරුණු හා ක්‍රියා කටයුතු පිළිබඳ ප්‍රතිපත්තීන් ව්‍යුහගත හා සූත්‍රගත කිරීම සඳහා පහසුකම් සැලසීම.

VI. කලින් කලට සභාපති/ අධ්‍යක්ෂක ජනරාල් විසින් පවරනු ලබන වෙනත් කාර්යයන් ඉටු කිරීම.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගනු ලබන, කළමනාකරණය/ විද්‍යාව/ කෘෂිකර්මය / වාණිජ්‍ය/ ව්‍යාපාර පරිපාලනය/ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ක්ෂේත්‍රයේ, ප්‍රථම උපාධියක්

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්/ මාස්ටර්ස් උපාධියක් හෝ තනතුරට අදාළ විෂය පථයට අදාළ වන, පිළිගත් වෘත්තියවේදී වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

**සහ**

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද

02. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තියවේදී වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය.

**සහ**

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද

**අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

01. බාහිර අපේක්ෂකයින්ගේ වර්ගීකරණයට අනුව දක්වා ඇති සුදුසුකම් සපුරාලීම

**හෝ**

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරු කාණ්ඩයේ (MM-1 ශ්‍රේණිය) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :**

වයස අවුරුදු 35 ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට අදාළ නොවනු ඇත.

**වැටුප් පරිමාණය :**

HM 1-3-2016-86,865-15X2,270-120,915

**වෙනත් ඉපයීම් :**

රුපියල් 50,000/- ක රථවාහන දීමනාව හා ඉන්ධන දීමනාව යනාදිය පිරිනැමේ.

**ඩේටා කොන්දේසි හා නියමයන් :**

මෙම කාණ්ඩයේ සියලු බඳවා ගැනීම් හා උසස්වීම් NEDA හි, බඳවාගැනීම් යෝජනා ක්‍රමයේ ප්‍රතිපාදන / විධිවිධානවලට දැඩිව අනුකූලව සිදුකරනු ලැබේ.

**තෝරාගැනීමේ නිර්ණායක/ උපමාන :**

* NEDA විසින් පත්කරනු ලබන, මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව බඳවාගැනීම් සිදුකරනු ලැබේ.
* අයදුම්කරුගේ කැපී පෙනෙන, අද්විතීය සුදුසුකම්, පළපුරුද්ද හා සම්මුඛ පරීක්ෂණයේදී විදහා පෙන්වනු ලබන කාර්ය සාදනයන් ප්‍රකාරව, තනතුරට අයදුම්කරුවෙකු තෝරාගනු ලැබේ.

නිසි පරිදි සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් සියලු අධ්‍යාපනික හා වෘත්තිය පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග **2021 නොවැම්බර් මස 22 වන දිනට හෝ ඊට පෙර** පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ, ලේඛන ගත තැපෑලෙන් එවීම සිදුකළ යුතුවන අතර, අයදුම්පතේ මෘදු පිටපතක්, Chairman@neda.gov.lk විද්‍යුත් ලිපිනයට එවිය හැකිය. ඉහත දිනයෙන් පසුව ලැබෙන ප්‍රමාද කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ. රජයේ ආයතනවල/ රාජ්‍ය සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඔවුනගේ නිර්දේශ ද සමග යොමුකළ යුතුය. මෙයට අමතරව, අයදුම් කරනු ලබන තනතුර, කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කළ යුතුය.

**සභාපති/ අධ්‍යක්ෂක ජනරාල්,**
**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය,**
**අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05.**